**භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය - 2015**

---------------------------------------------------------------

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික වෙන්කිරීම් අනාවරණය කිරීමේදී විශ්‍රාම ගන්වන වයස ඉක්මවූ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිකය ජංගම වගකීම් ලෙසත් ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙසත් නිරූපනය කිරීම වෙනුවට රු. 125,128,193 ක් වූ මුළු පාරිතෝෂික වෙන්කිරීම, ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් ඊට පටහැනිව දැනට භාවිතා කරනු ලබන ධාරණ අගය ශුන්‍ය වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර රු.26,361,994 ක ප්‍රාග්ධන ලාභයක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

**2.2.2 සම්බන්ධිත පාර්ශව සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම**

කාර්යාංශයට සියයට 66 ක හිමිකමක් ඇති අනුබද්ධිත ආයතනයකින් සේවකයින් 105 දෙනෙකු කුලී පදනමට ලබාගෙන එම සමාගම වෙත සමාලෝචිත වර්ෂයේදී රු. 37,344,658 ක් ගෙවීම හා කාර්යාංශයේ පරිශ්‍රයක එම ආයතනය පවත්වාගෙන යාම වෙනුවෙන් රු. 1,230,325 ක ආදායම් ලැබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සංවර්ධන පිරිවැය ගිණුම්ගත කිරීම සඳහා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණ අතර පද්ධති අධ්‍යයනයක් සිදුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට වර්ෂ තුනකට පෙර ගෙවා තිබුණු රු.1,505,000 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් හඳුනාගැනීමේදී වත්කමේ ජීවකාලය හඳුනාගෙන නොතිබූ බැවින් ඉකුත් වර්ෂවල පාරිභෝජනය කළ රු. 10,687,383 ක් වූ පාරිභෝගික ද්‍රව්‍ය තවදුරටත් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) සේවාදයකයා වෙනුවෙන් මිලදීගෙන ඔවුන් විසින් ප්‍රතිපූරණය කරන ලද රු. 2,046,540 ක් වටිනා වත්කම් කාර්යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සේවක සුභසාධනය සඳහා ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු රු.1,321,648 ක මුදලක් සේවක ශුභසාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන අරමුදලට බැර කළ යුතු වුවත් දේශීය ප්‍රදාන ගිණුමට බැර කර තිබුණි.

(ඈ) කාර්යාංශය විසින් රු.130,476,703 ක් ගෙවා මිලදී ගෙන තිබූ ඕරුගොඩවත්ත ඉඩම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන තිබියදී මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් ජංගම නොවන වත්කමක් ලෙස නිරූපණය කර තිබුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ පහ ඉක්මවූ එකතුව රු.3,312,205 ක් වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හා එකතුව රු.4,218,727 ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | නියමිත අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.231,784,375 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා එකතුව රු.823,562,324 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ II වන කොටසේ 6(2)(අ) ඡේදය | මාසයක දළ වැටුප මත පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිලධාරියෙකුට රු.609,070 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>(i) XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මාසික මූලික වැටුප පදනම් කර ගෙන ආපදා ණය ගෙවිය යුතු වුවත් දීමනා ඇතුළත් මාසික දළ වැටුප පදනම් කරගෙන රු. 250,000 ඉක්මවා ආපදා ණය ගෙවා තිබූ අතර ඒ අනුව ගෙවිය හැකි මුදල ඉක්මවා රු. 9,053,927 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ii) XXX පරිච්ඡේදයේ 1.4 හා 1.4.1 වගන්ති | ලේකම්වරයාගේ අවසරයකින් තොරව නිලධාරීන් තිදෙනෙකු විසින් කාර්යාංශයට අනුබද්ධිත ආයතනයකට වෘත්තිමය සේවා සැපයීම සිදුකර සමාලෝචිත වර්ෂයේදී රු.1,969,500 ක් උපයාගෙන තිබුණද ආයතන සංග්‍රහයේ විධිවිධානය පරිදි රාජ්‍ය භාග ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 (2) | සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ සිදු වූ වාහන අනතුරු 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6 (iii) වගන්තිය | නියමිත සංයුක්ත දීමනාව ඉක්මවා කාර්යාංශයේ නිළධාරීන් 9 දෙනෙකු වෙත රු. 469,300 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ) | 1996 අගෝස්තු 02 දිනැති අංක පීඊ1/000/6 දරන භාණ්ඩාගාර ලිපිය | දිරිදීමනා ගෙවීම සඳහා භූ විද්‍යා හා ඛනිජ ගවේෂණවලින් ලැබෙන ශුද්ධ ඉපයීම් පමණක් භාවිතා කළ යුතු වුවත් පරීක්ෂණ ගාස්තු හා පරීක්ෂණ පිපුරුම් ගාස්තු ආදායම වූ රු. 144,724,836 ක්ද දිරිදීමනා ගෙවීම සඳහා යොදාගෙන තිබුණි. |
| (උ) | 2015 සැප්තැම්බර් 10 දිනැති විනිමය පාලකගේ අවසර දීමේ ලිපිය 2(b), 4 හා 5 වගන්ති | සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ ආරම්භ කර තිබූ විශේෂ විදේශ විනිමය ගිණුමෙන් දේශීය ගෙවීම් ශ්‍රී ලංකා මුදලින් කළ යුතු වුවත් ඊට පටහැනිව දේශීය ආයතනයක් වෙත ඇ.එ.ඩො. 105,402 ක් ගෙවා තිබුණු අතර එම ගිණුම 2016 ජනවාරි 14 දින දක්වා පමණක් පවත්වාගෙන යාමට විනිමය පාලක විසින් අවසර දී තිබුණද විගණිත දිනය වූ 2016 මැයි මාසය වනවිටත් ගිණුම පවත්වා ගෙනගොස් තිබුණි. තවද එම ගිණුම් විස්තර හා ඊට අදාළ ගෙවීම් විස්තර විනිමය පාලක වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,037,093,870 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.826,918,428 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.210,175,442 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනය කෙරෙහි රාජ්‍ය භාග ආදායම රු.159,831,410 කින් හා පරීක්ෂණ ගාස්තු ආදායම රු.42,431,093 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කලද 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී කාර්යාංශයේ දායකත්වය 2011 වර්ෂයේ රු.821,150,804 ක් වූ අතර 2015 වර්ෂයේදී රු.1,547,924,501 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශවයන් නඩු 13 ක් පවරා තිබූ අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 02 ක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

----------------

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව ඛනිජ ගවේෂණය, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය විධිමත් කිරීම කාර්යාංශයේ ප්‍රධාන අරමුණු විය.

(අ) කාර්යාංශයේ කාර්යයන් අතරින් භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක තිබූ අතර පතල් කැනීමේ වාණිජමය ශක්‍යතාවය පිළිබඳව ඇගයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය, වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්කර්ෂණය කිරීම සහ නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම යන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැලසුම්කළ 1: 50,000 භූ රසායනික සිතියම් වැඩසටහන යටතේ වව්නියාව, පාන්කුලම, මහඔය, රක්වාන හා තංගල්ල ප්‍රදේශවල කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. තවද පළාත් ඛනිජ සමීක්ෂණ වැඩසටහනේ සබරගමුව පළාතට අදාළව කිසිදු ක්‍රියාකාරකමක්ද සිදුකර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) රාජ්‍ය භාග මුදල් අය කිරීම.**

(i) නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතාකිරීම වෙනුවට පුපුරණ ද්‍රව්‍ය පාලක වාර්තා පදනම්කරගෙන රාජ්‍ය භාග ගණනය කිරීම හේතුවෙන් කලුගල් කැනීම් වෙනුවෙන් සැලකිය යුතු රාජ්‍ය භාග මුදලක් අහිමිවීමේ අවධානමක් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) බලපත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණය ඉක්මවා කැනීම් කර ඇති අවස්ථාවලදී ඊට අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා වැඩිපුර කැනීම් කර ඇති ප්‍රමාණය සඳහා රාජ්‍ය භාගය අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කාර්යාංශය අවධානය යොමු කර නොතිබුණි.

(iii) කාර්යාංශය විසින් ඛනිජ ද්‍රව්‍යවල වෙළඳපල වටිනාකම පදනම් කරගෙන රාජ්‍ය භාග ගණනය කළද 2011 වර්ෂයෙන් පසුව එම අගයන් සංශෝධනය කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාකර නොතිබුණි.

**(ආ) බලපත්‍ර නිකුත් කිරීම හා ගාස්තු අය කිරීම.**

(i) බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත් ඊට අදාල එකතු කළ අගය මත බදු හා මුද්දර ගාස්තුද අයකර තිබුණි. මීට අමතරව බලපත්‍රය මගින් කැනීම් කරන ඛණිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාගය සඳහා අත්තිකාරම් මුදලක් අයකර තිබුණි. මේ හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි අයදුම්පත්වලට අදාලව විශාල මුදලක් කාර්යාංශයේ නිරන්තරයෙන් සමුච්චිතව පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතු අගය රු. 111,348,683 ක අත්තිකාරම් ශේෂයක් විය.

(ii) නීති විරෝධී කැනීම් පාලනය සඳහා වැටලීම් ඒකකයක් ස්ථාපිත කර නොතිබීම නිසා දීප ව්‍යාප්තව නිරන්තරයෙන් අනවසර කැනීම් සිදු වුවත් ඒ සඳහා නිත්‍යානුකූලව කටයුතු කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඈ) කැනීම් භූමි පුනරුත්ථාපනය සඳහා ලබාගන්නා බැංකු ඇපකරවල වටිනාකම තීරණය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් දක්නට නොතිබුණි.

(ඈ) විවිධ රටවල භූ විද්‍යාඥයින්ගේ සංගම් 13 කින් 2013 හා 2014 වර්ෂවල විද්‍යාත්මක ජ'නල් මිලදීගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 3,633,770 ක් වියදම් කර තිබුණි. වර්ෂයට අදාල ජ'නල් වර්ෂයේම මිලදී නොගෙන දීර්ඝ කාලයක් ගත වීමෙන් අනතුරුව මිලදීගෙන තිබූ අතර ආයතනය ඉන් ලබා ගන්නා ප්‍රයෝජන විගණනයට සනාථ නොවුණි.

(ඉ) යක්කල ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් නිරීක්ෂණ හා ඊට අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර පාලන අධිකාරිය විසින් ගෙන නොතිබූ අතර භාණ්ඩ වර්ග 412 ක ඒකක 9,925 ක ඌනතාවය තක්සේරු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) භූ විදුම් ව්‍යාපෘති සඳහා සේවාදායකයින් ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ආයතනික මට්ටමින් ව්‍යාපෘති ලබාගැනීම සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් පෙර වර්ෂය හා සැසදීමේදී භූ විදුම් ව්‍යාපෘති ආදායම සියයට 27 කින් පමණ අඩු වී තිබුණි.

(උ) භූ කම්පන මාන කුළුණු නඩත්තු වෙනුවෙන් 2000 වර්ෂයේ සිට විදේශයකින් ලැබී තිබූ මුදල්වලින් සමාලෝචිත වර්ෂය වන විට රු. 6,887,885 ක් කාර්යාංශය තුළ එකතු වී තිබුණි. මෙම මුදල් අදාල පාර්ශව වෙත ගෙවීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) අන්තර්ජාතික න්‍යෂ්ඨික අවිහරණ සම්මුති සංවිධානයේ ( CTBTO ) සමුළුවක දේශීය අනුග්‍රහකත්වය කාර්යාංශය විසින් සිදුකර තිබුණි. හෝටල් පහසුකම් වෙන්කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදුකර නොතිබූ අතර ලංසු ඉදිරිපත් කළ ආයතන දෙකක පැවැත්ම තහවුරු කිරීමට කාර්යාංශය අපොහොසත් විය. තවද එකඟ වූ ලංසු මිලගණන් ඉක්මවා රු.284,000 ක් ගෙවීම් සිදුකර තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පල්ලෙකැලේ භූ කම්පනමාන කුළුණු නඩත්තු කටයුතු සඳහා වූ අවබෝධතා ගිවිසුමට පටහැනිව රු. 215,372 ක විවිධ දේශීය බදු විදේශ ජංගම ගිණුමෙන් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා ලෙස ගෙවූ රු.56,915,835 ක මුදල ගණනය සඳහා පෞද්ගලික විගණන සමාගමකින් විගණනය කරන ලද ගිණුමක් භාවිතා කර තිබූ අතර එහි ලාභය විගණකාධිපති වෙත ලබා දී තිබූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ව්‍යාපෘති ලාභයට වඩා රු. 31,951,689 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද එහි ලැබිය යුතු ආදායම් ලෙස ඇතුළත් කර තිබූ රු.8,973,399 ක මුදලක් 2016 අප්‍රේල් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) කාර්යාංශයේ සේවය නොකරන නිළධාරීන් දෙදෙනෙකු විදේශ පුහුණුවකට යැවීම වෙනුවෙන් සංයුක්ත දීමනා හා වෙනත් වියදම් ලෙස කාර්යාංශය විසින් රු. 953,258 ක් දරා තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ නිළධාරීන් සිව්දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී පසුව ගිවිසුම් ප්‍රකාරව අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ නොකර කාර්යාංශයෙන් ඉවත්වීම් මත අයකර ගත යුතු දණ්ඩන මුදල් සහ අනෙකුත් වියදම් ලෙස රු. 2,921,783 ක් අයකර ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) නව කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය 2013 ජුනි 28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ අතර ඊට අදාළ බඳවාගැනීමේ කාර්ය පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර අනුමත කර නොගැනීම හේතුවෙන් පැරණි බඳවාගැනීමේ කාර්ය පරිපාටිය පදනම් කරගෙන නිළධාරීන් සඳහා උසස් වීම් ප්‍රදානය කර තිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

-------------------------

හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් ලබාගෙන තිබූ රු. 597,231 ක් වටිනා උපකරණ ආපසු භාර දී නොතිබූ අතර එම අලාභ අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි.

**4.6 වියිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

-------------------------------------------------------------

ඉඩමේ සිදුකරන සංවර්ධනයන් හා ඉදිකිරීම්වල අයිතිය බදු කාලය අවසානයේ බදු දීමනාකරුට හිමිවන බවත් ඒ සම්බන්ධයෙන් කිසිදු දීමනාවක් ඉල්ලා සිටීමට බදු ගැණුම්කරුට අයිතියක් නොමැති බවත් ගිවිසුමේ සඳහන්ව තිබියදී කාර්යාංශය විසින් කල්බදු පදනම මත ලබාගෙන තිබූ ඉඩමක රු. 46,035,957 ක් වැය කර ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කාර්යය සඳහා කාර්යාංශයේ සභාපතිවරයාට වගකියන විගණකවරයෙකු පත් කර ඇතත් ඔහුට සහාය වීම සඳහා ස්ථිර විගණන කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණකගේ විගණනය පිළිබඳ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන විමසුම් හයකට අදාල අංශ විසින් පිළිතුරු දී නොතිබූ අතර විගණන අනාවරණයන් පිළිබඳ ඉදිරි කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් දක්නට නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මුහුදු වැලි කැනීම සඳහා නිකුත් කර තිබුණු බලපත්‍රයක් වෙනුවෙන් 2013 හා 2104 වර්ෂ සඳහා අයවිය යුතු රු. 44,727,062 ක් වූ රාජ්‍යභාග හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම එම ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාවල සඳහන් වූ ඝන මීටර් 2,269,563 ක වැලි තොගයක් සඳහා අයවිය යුතු රු. මිලියන 100 කට අධික රාජ්‍ය භාග මුදල්ද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 16 සිට සියයට 4,812 ක පරාසයක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2013 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2016 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | තොග භෞතිකව සත්‍යාපනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර විධිමත් පරිදි බඳවාගැනීම සිදුකර නොතිබීම. |
| (ඇ) | තොග පාලනය | භාණ්ඩ ගබඩාවට භාරගැනීමෙන් තොරව සෘජුව අදාල අංශ වෙත නිකුත්කිරීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් පාලනය | විදේශ වලින් ලැබෙන උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | (i) ක්ෂේත්‍ර රාජකාරී ගමන් තහවුරු කර නොගැනීම.<br>(ii) ධාවනය පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව ඉන්ධන වියදම් ගෙවීම.<br>(iii) නීතිවිරෝධි කැනීම් සිදුවීම හා බලපත්‍ර කොන්දේසි කඩවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවලින් අනාවරණය නොකිරීම. |
| (ඊ) | බලපත්‍ර නිකුත් කිරීම් | (i) පාරිසරික නිරවුල් සහතික ලබා නොගෙන බලපත්‍ර නිකුත්කිරීම.<br>(ii) බලපත්‍ර පසුවිපරම් දුර්වල වීම.<br>(iii) ව්‍යාජ අත්සන් මත ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම හා අයදුම්පත් භාරගැනීම සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබීම. |